අභ්‍යාසය අංක 05

ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් ගණුදෙණු මුදල්පොතේ ජ'නලයේ සහ ලෙජරයේ සටහන් කිරීමපිලිබඳ අවබෝධයක් ලබා දීම

පුහුණු කරුට උපදෙස්

- අගල් 12 ක් දිග අගල් 6 ක් පළල බ්‍රිසිල් බෝඩ් කෑලි කපා අභ්‍යාසයේ ඇති සියළු ගණු දෙණු එක් එක් කෑල්ලේ වෙන වෙනම සටහන් කර පෙට්ටියක බහා ලන්න

- මුදල් හුවමාරු වන ගනුදෙණු ලෙජරයේ සටහන් කිරීම පිලිබඳ පාඩම පටන් ගැනීමත් සමගම මෙම අභ්‍යාසය ආරම්භ කල යුතු අතර පළමුවෙන්ම පුහුණු වන්නන් සහභාගී කර ගෙන පෙට්ටියේ ඇති ගණු දෙණු වලින් මුදලින් සිදු වී ඇති ගණු දෙණු හා මුදලින් සිදු වී නොමැත් ගණු දෙණු හදුනා ගන්නා ලෙස උපදෙස් දෙන

- සහභාගී වන්නන් එකිනෙකා ගෙන මෙම කාර්යය කල යුතු අතර හදුනා ගත් ගණුදෙණු වලින් මුදලින් සිදු වූ ගණුදෙණු එක් පෙට්ටියකත් මුදලින් සිදු නොවූ ගණුදෙණු තවත් පෙට්ටියකත් දමන ලෙස උපදෙස් දෙන්න. එක් එක් පුද්ගලයා විසින් ලබා ගත් ගණුදෙණුව සභාවට පෙන්වා අදාල පෙට්ටියේ දමන ලෙස උපදෙස් දෙන්න. පෙට්ටියට දැමූ පසු නිවැරදි පෙට්ටියට දැමූවා දැයි සහභාගී වන්නන් ගෙන් විමසන්න. වැරදි පෙට්ටියක තැන්පත් කරන ලද්දේ නම් සහභාගී වන්නන්ගෙන් විමසා නිවැරදි පෙට්ටියේ තැන්පත් කරන ලෙස උපදෙස් දෙන්න. ඉහත කාර්යය කිරීම සඳහා මුදලින් සිදු වූ ගණුදෙණු නමින් වෙනම පෙට්ටියක් සහ මුදලින් සිදු නොවූ ගණු දෙණු යනුවෙන් සටහන් කරන ලද තවත් පෙට්ටියක් සූදානම් කර තිබිය යුතුය

- ඉන් පසුව සියළු දෙනාටම පෙනෙන සේ මුදල් පොතේ ආකෘතියක් ඇද ප්‍රදර්ශණය කරන්න.

- මුදලින් සිදු කරන ලද ගණු දෙණු පෙට්ටිය ගෙන එහි ඇති ගණුදෙණු මුදල් පොතේ නියමිත පැත්තේ අලවන ලෙස සහභාගී වන්නන්ට උපදෙස් දෙන්න. මෙය එක් එක් පුහුණු ලාභියා විසින් කල යුතු අතර අදාල කාඩ්පත මුදල් පොතේ නිවැරදි පැත්තේ ඇලවීමෙන් පසු එය නිවැරදි දැයි අනෙකුත් අයගෙන් විමසන්න. වැරදි නම් නිවැරදි කරවන්න.

- මෙලෙස මුදලින් සිදු වූ සියළු ගණුදෙණු සියල්ලම මුදල්පොතේ නියමිත පැත්තේ අලවන්න

- මුදලින් සිදු වී ඇති සෑම ගණුදෙණුවක් සදහාම එම ගණුදෙණුව ඇතුලත් කාඩ්පත් දෙකක් සකස් කල යුතු අතර එම කාඩ්පත් දෙකම නොගැලවෙන සේ එකට අමුණා තිබිය යුතුය

- මුදල්පොතේ ගණුදෙණු ලෙජරයේ අදාල ගිණුමේ සටහන් කිරීම පිළිබඳ පාඩම අවසන් වූ පසු දැනට සකස් කර ඇති මුදල්පොතේ ඇති ගණුදෙණු ලෙජරයේ අදාල ගිණුම හදුනාගෙන එහි නියමිත පැත්තේ අලවන ලෙස උපදෙස් දෙන්න

- ලෙජරයේ ඇති ගණුදෙණු වලට අදාල ගිණුම් ඔබ විසින් සුදු කඩදාසි වල සකස් කර ගෙන පැමිනිය යුතු අතර ඒවා මේ වන විට බිත්තියේ ප්‍රදර්ශනය කරන්න.

- මුදල්පොතේ ඇති සෑම ගණුදෙණුවකම ඇති කාඩ්පත් දෙකෙන් එකක් ගලවාගෙන එය අදාල ගිණුම තෝරාගෙන එහි නියමිත පැත්තේ අලවන ලෙස පුහුණු වන්නන්ට උපදෙස් දෙන්න

- අදල ගණුදෙණුව තෝරා ගැනීම පිළිවෙලට කල යුතු අතර තෝරා ගණු ලැබූ සෑම ගණුදෙණුවක්ම පුහුණු වන්නන්ට ප්‍රදර්ශණය කර ඉන්පසුව ඇලවිය යුතුය

- අදාල ගණුදෙණුව ගිණුමේ ඇල වූ පසු ඒ පිළිබදව සහභාගී වන්නන්ගේන විමසිය යුතු අතර වැරුද්දක් තිබේ නම් ඔවුන්ගෙන් විමසා නිවැරදි කල යුතුය
- මෙලෙස මුදල්පොතේ ඇති සෑම ගණුදෙණුවක්ම සහභාගී වන්නන් සම්බන්ධ කර ගෙන ලෙජරයේ අදාල ගිණුම් වල අලවන්න
- අවසානයේ මුදලින් සිදු කරන ලද සියළුම ගණුදෙණු මුදල්පොතේ සහ ලෙජරයේ අදාල ගිණුම් වල සටහන් කර ඇති බව පෙන්වා දෙන්න. මේ පිළිබදව සහභාගී වන්නන්ගෙන් අදහස් විමසන්න
- මුදලින් සිදු නොකරන ලද ගණුදෙණු ජ'නලයේ සටහන් කිරීම පිළිබදව පාඩම අවසන් වූ පසු මුදලින් සිදු නොවූ ගණුදෙණු පෙට්ටිය ගෙන එහහි ඇති ගණුදෙණු ජ'නලයේ අලවන ලෙස සහභාගී වන්නන්හට උපදෙස් දෙන්න

- පැහැදිලිව පෙනෙන ජ'නල් සටහන් ආකෘතියක් ඔබ විසින් බිත්තියේ ප්‍රදර්ශනය කල යුතු අතර සෑම මුදලින් සිදු නොවූ ගණුදෙණුවක් වක් සමගම එය හර කරන හා බැර කරන ගිණුම සදහන් කාඩ්පත් දෙක නොගැලවෙන සේ අමුණා තිබිය යුතුය
- එක් එක් පුහුණුලාභියා ගෙන අදාල ගණුදෙණුව ජ'නල් සටහන ආකෘතියේ නිවැරදිව අලවන ලෙස උපදෙස් දෙන්න
- කාඩ්පත් ඇලවීමෙන් පසුව සහභාගී වන්නන්ගෙන් ඒ පිලිබදව විමසන්න. වැරදි නම් නිවැරදි කරන්න
- පුහුණු වන්නන් ද සහභාගී කරගෙන එක් එක් ජ'නල් සටහනට අදාල විස්තරය එම සටහන යටින් ලියන්න
- මෙලෙස සියළුම මුදලින් සිදු නොවූ ගණුදෙණු වලට අදාල ජ'නල් සටහන් ප්‍රදර්ශණය කිරීමෙන් පසුව ඒ පිලිබදව සියළු දෙනාගේම අවධානය යොමු කරවා ක්‍රියාකාරකම අවසන් කරන්න
- ජ'නල් සටහන් ලෙජරයේ අදාල ගිණුම් වල සටහන් කිරීම පිලිබදව පාඩම අවසන් වූ පසුව එක් එක් ජ'නල් සටහනේ ඇතුලත් ගණුදෙණු ලෙජරයේ අදාල ගිණුමේ නිවැරදි පැත්තේ අලවන ලෙස උපදෙස් දෙන්න. මේ වන විට ලෙජරයේ සියළු ගිණුම් ප්‍රදර්ශනය වෙමින් පවතී
- පුහුණු වන්නකු කැදවා අංක 1 ජ'නල් සටහනේ ඇති හර කරන ගිණුමට අදාල සටහන් ඉහත ප්‍රමාණයේ බ්‍රිසිල්බෝඩ් කාඩ්පතක අලවා නියමිත ගිණුමේ නියමිත පැත්තේ අලවන ලෙස උපදෙස් දෙන්න
- ඊලග පුහුණුලාභියා කැදවා එම සටහනේ බැර කරන ගිණුමට අදාල සටහන ඉහත ප්‍රමාණයේම බ්‍රිසිල්බෝඩ් කාඩ් පතක ලියා ලෙජරයේ නියමිත ගිණුමේ අලවන ලෙස උපදෙස් දෙන්න
- සෑම ගණුදෙණුවක්ම අනෙකුත් පුහුණුලාභීන්ට ප්‍රදර්ශනය කල යුතු අතර ඇලවීමෙන් පසුව ඒ පිලිබදව ඔවුන්ගෙන් විමසා අවශ්‍ය නිවැරදි කිරීම් කල යුතුය
- මෙලෙස ජ'නලයේ ඇති සෑම ගණුදෙණුවක්ම ලෙජරයේ අදාල ගිණුම්වල පුහුණු වන්නන් විස්න් ඇලවිය යුතුය
- අවසානයේ සියළු දෙනාගේම අවධානය යොමු කරවා සටහන් කිරීමේ පහසු බව පෙන්වා දෙන්න
- ඉන් පසුව මෙතෙක් කරන ලද සියළුම ක්‍රියාකාරකම් කෙරේ අවධානය යොමු කරවා ක්‍රියාකාරකම අවසන් කරන්න

- මෙම ක්‍රියාකරකමේ කාර්යක්ෂමතාව රඳා පවතිනුයේ ඔබගේ පෙර සූදානම සහ එය ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ආකාරය මත බැවින් ඔබ පුහුණු වැඩ සටහනට පැමිනෙන විට නොවරදවාම අදාල කාඩ්පත් සූදානම් කර ගෙන පැමිනෙන්න. එසේම පුහුණු වන්නන්ට විනෝදයක් ඇති වන ආකාරයට ක්‍රියාකාරකම පවත්වාගෙන යන්න. සෑම විටම මේ සම්බන්ධයෙන් දී ඇති උපදෙස් පිලිපදින්න
- කාඩ්පත් ගබා දිමේ දී පැහැදිලි සහ කැපී පෙනෙන ආකාරයේ කාඩ්පත් සහ අදාල ආකෘති නිවැරදි ලෙස පැහැදිලිවසකස් කර තිබීම මත මෙම ක්‍රියාකාරකමේ සාර්ථකත්වය රඳා පවතින බව අමතක නොකරන්න.